

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 204

අන්තර්ගතය

පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය 03	- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය 04	- කාර්ය සාධන දර්ශක
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව

ඡායාරූප පෙළ

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ හින්දු ආගමික කටයුතුවලට අදාළව සියලුම විෂයන්ට වගකිවයුතු දෙපාර්තමේන්තුවක් ලෙස 1985 ඔක්තෝම්බර් 02 දිනැති අංක (1985/123-12) දරන අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත 1986 වන වර්ෂයේ ජනවරි මස පළමුවන දින පිහිටුවන ලදී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණ

දැක්ම

ආදර්ශමත් යහපත් චරිතයකින් යුත් හින්දු සමාජයක් කරා...

මෙහෙවර

නවක්‍රම කණ්ඩායම් සේවය හා සමාජීය සහයෝගය මගින් විශිෂ්ඨ අනුග්‍රහක මධ්‍ය සැලසුම් ලබාදීම මගින් හින්දු ආගම ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය සහ විදහා පෑම

අපගේ වටිනාකම්

- දේශය සඳහා වූ සේවය

  අප ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ කොටසකි. අපි ඉතා කැපවීමකින් අවංකව විශිෂ්ඨත්වයෙන් හා කාර්යක්ෂමව ක්‍රියා කරන්නෙමු.
- විශිෂ්ඨත්වය සඳහා වූ ඇති උද්යෝගය

  අපගේ ක්‍රියාවන් සියල්ලක්ම වාගේ ඉතා විශිෂ්ඨව පැවතිය යුතුයි යනු අපගේ අරමුණ වේ.
- සමාජය ගොඩනැගීම.

  අපගේ ප්‍රජාව අප ඉතා ගෞරවයෙන් සලකන අතර විස්වාසනීය කණ්ඩායමක් ලෙස ගොඩ නැගෙමු.
- දැඩි විශ්වාසය දිරි ගැන්වීම

  මහජනතාවගේ විශ්වාසය දිරිගැන්වීමට අපි ඉතා විශ්වාසවන්ත ලෙස ද වෘත්තිය නිපුණතාවයෙන් ද අවංකවද සේවය කරන්නෙමු.
- ස්ථාවර නව ක්‍රමයක්
- අපි නිරන්තර ප්‍රගතිය හා පරිවර්තනයන් කරා ඉදිරියට පිය නගමු.

අරමුණ

- සදාචාරාත්මක ගුණාත්මක ලෙස සහ හින්දු ආගමික අගය තුලින් හින්දු ළමුන් අතර හින්දු ආගම් අධ්‍යාපනය දිරි ගැන්වීම.
- හින්දු ආගම හා සංස්කෘතිය රැක ගැනීම උදෙසා හින්දු ආගම් පරිපාටිය සංරක්ෂණය කිරීම.
- හින්දු ආගම හා සංස්කෘතිකය සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හින්දු ආගමික කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිලිබඳ උසස් සිතුවිලි මහජනයා අතර පැතිර වීම.
- දමිළ කලාකරුවන්ගේ සහභාගිත්වයෙන් දමිළ කලාවන් ආරක්ෂාකර එය ප්‍රවර්ධනය කිරීම හා එය අනාගත පරපුර වෙත භාරදීම.
- හින්දු චාරිත්‍ර පදනම් වූ සංස්කෘතිය, සමාජීය, ආගම් හා ආධ්‍යාත්මික වර්ධන විධිවිධාන සඳහා හින්දු කෝවිල් හා හින්දු සංවිධානයන් දිරි ගැන්වීම.

1.3 ප්‍රධාන කාර්ය

අදාළ සංවිධාන

1.3.1 ලියාපදිංචි කිරීම හා යාවත්කාලීනය

- හින්දු කෝවිල්
- හින්දු ආගමික සංවිධාන හා සමාජීය ආයතන
- හින්දු ආගමික දහම් (අරනෙරි) පාසල්
- හින්දු ආගමික හා දමිළ කලාවට අයත් සංවිධාන හා වෙනත් සමාජ ආයතනයන්

1.3.2 1985 වර්ෂයේ අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනත යටතේ ස්ථාපිත වූ හින්දු සංස්කෘතික අරමුදල පරිපාලනය කිරීම හා නියාමනය කිරීම.

1.3.3 හින්දු ආගමික ක්‍රියා මාර්ගයට අදාළ අන්තර් ජාතික සම්බන්ධතාවයන් පහසු කිරීම හෝ ලිහිල් කිරීම.

- හින්දු ආගමික පූජකවරුන් හින්දු ආගමික පැවිදි අය කලාකරුවන් හා හින්දු ආගමික සේවකයින්ට වීසා සම්බන්ධ නිර්දේශ කිරීම හා අදාළ ක්‍රියාවන් මෙහෙය වීම.
- වන්දනා ගමන් හා ආගමට අදාළ වෙනත් කටයුතු සඳහා පහසුකම් සැළසීම හා නිර්දේශ කිරීම.

1.3.4 හින්දු පූජකතුමන් හා හින්දු ආගමික වැඩිහිටියන්ගේ සේවාවන් ප්‍රමුඛතාවය ලබා දීම මුල් කර ගෙන විශේෂ හැදුනුම්පත් නිකුත් කිරීම හා හින්දු දහම් (අරනෙරි) පාසල් ගුරුවරුන්ගේ අරනෙරි අධ්‍යාපන ක්‍රමය පහසු කිරීම උදෙසා හින්දු ආගමික දහම් (අරනෙරි) පාසල් ගුරුවරුන්ට විශේෂ හැදුනුම්පත් නිකුත් කිරීම.

1.3.5 හින්දු ආගමික දහම් (අරනෙරි) අධ්‍යාපනය දිරි ගැන්වීම.

- හින්දු ආගමික දහම් (අරනෙරි) පාසල් සඳහා වූ පාඨමාලාවන් හදුන්වා දීම හා ප්‍රතිසංස්කරණය.
- දහම් (අරනෙරි) පාසල් ක්‍රමවත් හා සුමටව පවත්වාගෙන යාමට උපදෙස් හා මග පෙන්වීම ලබාදීම.
- දහම් (අරනෙරි) පාසල්වල අධ්‍යාපනයට අවශ්‍ය පොත්පත් හා භාණ්ඩ නොමිලේ ලබා දීම.
- දහම් (අරනෙරි) ගුරුවරයින්ගේ හා අදාළ පාසල් පරිපාලන සංවිධානයේ නිපුණතාවයන් ප්‍රවර්ධනයට උචිත අන්දමට අඛණ්ඩව නිපුණතා වර්ධනය ප්‍රවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- දහම් (අරනෙරි) පාසල් ගුරුවරුන්ට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නොමිලේ නිල ඇදුම් ලබා දීම.
- යෝග අභ්‍යාස පන්නිගෙ වැනි දහම් (අරනෙරි) විශේෂ පාඨමාලා සඳහා දායකත්වය ලබා දීම.

1.3.6 හින්දු ආගමික පර්යේෂණ ක්‍රියා මාර්ගයන් දිරි ගැන්වීම.

- හින්දු ආගම් චාරිත්‍රයට අදාළ ප්‍රකාශන ඉදිරිපත් කිරීම එසේම ලබාගත් දුර්ලභ ග්‍රන්ථ නැවත සංස්කරණය කිරීම.
- හින්දු ආගම සම්බන්ධ පර්යේෂණ සේවාවන් ප්‍රකාශන මගින් දිරි ගැන්වීම.
- අන්තර් ජාතික හා දේශිය විද්වතුන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ හා සංවාද පැවත්වීම.
- දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන්නාවූ පුස්තකාල මගින් පැරණි ග්‍රන්ථ පිලිබඳ ලේඛනයන් නොමිලයේ ලබා ගැනීමේ පහසුකම් ලබාදීම.

1.3.7 පහත සඳහන් විෂයන් සඳහා දේශිය රිතියට අනුකූලව ත්‍යාග ප්‍රදානය කිරීම මගින් දිරි ගැන්වීම හා එය බලාත්මක කිරීම.

- විශිෂ්ඨ නිර්මාණ ශක්තිය හෙළිදරව් කරන්නාවූ දහම් (අරනෙරි) පාසල් සිසුන්ට දේශිය නිපුණතා කුසලාන ලබාදීම පිරිනැමීම.
- විශිෂ්ඨ ලෙස කටයුතු කරන්නාවූ දහම් (අරනෙරි) පාසල්වලට හා එහි සේවය කරන ගුරුවරුනට දේශිය සේවා විශිෂ්ඨත්වය සඳහා ත්‍යාග ප්‍රදානය කිරීම.
- දමිළ කලාවන්ට ගෞරවයක් ලෙස සේවය ලබාදුන් ජෙෂ්ඨ කලාකරුවන් සඳහා කලාභූෂණ සම්මාන ප්‍රදානය ලබා දී ගෞරව කිරීම.
- හින්දු ආගම හා පාරම්පරික කලාව සම්බන්ධ කලාකරුවන් හදුනාගෙන ඔවුනට ත්‍යාග ප්‍රදානය කර ගෞරවය පිරිනැමීම.

1.3.8 සංවර්ධන සේවාවන්ට අවශ්‍ය අරමුදල් ලබා දීම.


- කෝවිල් නිර්මාණ හා ඉදිකිරීම් අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබාදීම.
- මහජනතාවගේ අධ්‍යාත්මික ජීවන ප්‍රවර්ධන කටයුතු සඳහා කෝවිල්වල පැවැත්වෙන "කුම්බාභිශේක" සහ අනෙකුත් විශේෂ පූජා වැඩසටහන් සඳහා මූල්‍ය ආධාර සැපයීම. (කෝවිල් පුන්කලස් අභිෂේක හා විශේෂ පුජා කටයුතු සඳහා ආධාර මුදල් ලබා දීම.)
- දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල් සඳහා ගොඩනැගිලි අරමුදල් හා යටිතල පහසුකම්, ඉදිකිරීම් කටයුතු සඳහා ආධාර මුදල් ලබාදීම.
- දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල්වලට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ආධාර මුදල් ලබා දීම.

1.3.9 හින්දු ආගමික සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති කෝවිල් හා ආගමික ආයතනවල ඇතිවන්නාවූ ආරවුල් නිරාකරණය කිරීම.

1.3.10 හින්දු ආගමික සංස්කෘතික අධ්‍යාපන ආයතනය මගින් හින්දු ආගමික සංස්කෘතික කටයුතු දෙපාර්තෙම්න්තුව යටතේ ලියාපදිංචි කර ඇති ආයතන සඳහා නිපුණත්ව ප්‍රවර්ධන වර්ධනය කිරීම සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම.

- හින්දු ආගමික පුජකවරුන් සඳහා ධාරිතා ප්‍රවර්ධනය
- හින්දු ආගමික කෝවිල් හා හින්දු ආගම් ආයතන පරිපාලන සංවිධානවල නිපුණතාවය ප්‍රවර්ධන සැලසුම්
- දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල් ගුරුවරුන් හා දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල් පාලකයින් සඳහා නිපුණතා ප්‍රවර්ධන අභ්‍යාස

1.4 සංවිධාන සටහන



1.4.1 දෙපාර්තමේන්තුවේ “SWOT” විශ්ලේෂණය

I. ශක්තීන්

- හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව න්‍යායාත්මක වන්නේ ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති අතර මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වන පරිදි රජයේ ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක වේ.
- දෙපාර්තමේන්තුව “A” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන අතර, අයවැයේ දී වෙනමම වැය ශීර්ෂයක් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.
- දෙපාර්තමේන්තුව ජාතියට සහ විශේෂයෙන්ම රටේ සියලුම ප්‍රදේශවල හින්දු ආගමික ප්‍රජාවට සේවා සපයයි.
- මහජනතාවට සේවා සැපයීම සඳහා අරනෙරි පාසල් අංශය, හින්දු ආගමික කටයුතු අංශය, හින්දු කෝවිල් අංශය සහ පර්යේෂණ අංශය වැනි අංශ ගණනාවක් දෙපාර්තමේන්තුව සතුව ඇත.

II. දුර්වලතා

- සියලුම තනතුරුවල පුරප්පාඩු පවතින අතර විශේෂයෙන් මාණ්ඩලික මට්ටමේ පුරප්පාඩු පැවතීම විශිෂ්ට සේවාවක් සැපයීමේ දී දුෂ්කරතාවයට මුහුණදීමට සිදුවී ඇත.
- දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරියෙකු නොමැතිවීම.
- මහජනතාව හා කාර්ය මණ්ඩලය සඳහා වාහන නැවැත්වීමේ පොදු පහසුකම් නොමැතිවීම.

III. අවස්ථාවන්

- දෙපාර්තමේන්තුවට සියලුම හින්දු සංවිධාන, හින්දු කෝවිල් සහ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී

ඇති හින්දු දහම් පාසල් සමඟ අන්තර් සබඳතාවක් ඇති කර ඇත.

- එකම ගොඩනැල්ලේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් ආගමික දෙපාර්තමේන්තු පිහිටා ඇති බැවින් ආගමික වැඩසටහන් එක්ව සංවිධානය කිරීමට හා ආගමික සහජීවනයක් ඇති කිරීමටත් උපකාර වී ඇත.

IV. තර්ජනයන්

- දෙපාර්තමේන්තුව සඳහා නීතිමය පනතක් නොමැති වීම.

1.5 දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන අංශ

පහත සඳහන් කරන ලද ආයතනයන්ගේ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය සඳහා ද දෙපාර්තමේන්තුවේ සේවාවන් විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මක කිරීමටත් පහත දැක්වෙන අත්‍යවශ්‍ය අංශ දෙපාර්තමේන්තුව විසින් පිහිටුවා ඇත.

- පරිපාලන අංශය
- මුදල් අංශය
- හින්දු කෝවිල් අංශය
- හින්දු ආගමික කටයුතු අංශය
- හින්දු දහම් අධ්‍යාපන (අරනෙරි) අංශය
- හින්දු පර්යේෂණ අංශය
- හින්දු සංස්කෘතික අරමුදල් අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයතන පහත සඳහන් පරිදි

- හින්දු ආගමික සංස්කෘතික අධ්‍යාපන ආයතනය
  - ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් අභ්‍යාස ස්ථානය, යාපනය
  - ස්වාමි විපුලානන්දර් පුහුණු මධ්‍යස්ථානය, මඩකලපුව
- හින්දු විශ්‍රාම ශාලාව, කතරගම
- නැගෙනහිර පළාත් ප්‍රාදේශිය කාර්යාලය, හින්දු සංස්කෘතික කේන්ද්‍රය, නාවට්කුඩා, මඩකලපුව.
- ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් මණිමණ්ඩබම්, යාපනය
- නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය, යාපනය
- උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලය, ගුරුකුලම්, ආනෙපන්ති, යාපනය

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2025 වර්ෂය සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්ථාවට මෙම පණිවිඩය දායක කිරීමට ලැබීම ගැන මම ඉතා සතුටු වෙමි.

පසුගිය වසර තුළ වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදනවලින් 94% කට වඩා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතුවලට අදාළ ඉලක්කගත කාර්යසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගත් බව සැලකිය යුතු කරුණකි.

දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ලෙසින් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ඉදිරියට යමින් සිටින අතර, ධර්මිෂ්ඨ, විනයගරුක සහ නීතිගරුක සමාජයක් ඇති කිරීම අරමුණු කර ගෙන ඇත. මෙම දැක්මට අනුකූලව, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන්නේ හින්දු භක්තිකයන් අතර, විශේෂයෙන් හින්දු දරුවන් අතර සදාචාරාත්මක හා ආගමික වටිනාකම් වර්ධනය කිරීම සඳහා හින්දු ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමයි.

හින්දු අරනෙරි පාසල් සංවර්ධනය, හින්දු ආගමික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය, හින්දු ආගම සහ සංස්කෘතිය පිළිබඳ පර්යේෂණ, හින්දු සංස්කෘතික හා කලාත්මක සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කිරීම සහ හින්දු කෝවිල් ඒ ආශ්‍රිත සංවිධාන සංවර්ධනය කිරීම ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක දෙපාර්තමේන්තුව සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර ඇත. මීට අමතරව, දුර්ලභ හින්දු ආගමික පොත් මුද්‍රණය කිරීම, "අරනේරි සාරම්" නමින් අනුක්‍රමික ගුවන් විදුලි වැඩසටහනක් විකාශනය කිරීම සහ අරනේරි ගුරුවරුන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීම වැනි වැදගත් මුලපිරීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

අවසාන වශයෙන්, අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කැපවීම සහ සේවය මම අවංකවම අගය කරමි. 2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී මඟ පෙන්වීම සහ අනුශාසක වය ලබා දීම වෙනුවෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනවි මහතාට සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. පී. සේනාධීර මහතාට මගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

වයි. අනිරුත්තනන්
අධ්‍යක්ෂ
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2025 දෙසැම්බර් 31 දිනෙන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තක්සා 2025	2024	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඝිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		270,806,000	260,704,000	ඒඝිඒ-3
-	තැන්පතු		2,671,972	3,551,653	ඒඝිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		7,958,763	6,230,979	ඒඝිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**281,436,735**	270,486,632	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**281,436,735**	270,486,632	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**816**	1,268,262	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**281,435,919**	269,218,370	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
129,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	128,465,091	111,548,457	
66,250,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	57,303,459	58,115,258	ඒඝිඒ-2(ii
57,250,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	52,226,435	64,304,567	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	46,462	
253,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**237,994,985**	234,014,744	
	මූලධන වියදම්				
6,300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	5,138,550	1,000,000	
3,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,600,172	4,844,643	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඝිඒ-2(ii
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	972,231	525,800	
36,000,000	වෙනත් මූලධන වියදම්	15	36,000,000	35,000,000	
47,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**44,710,953**	41,370,443	
	තැන්පතු ගෙවීම්		1,402,767	3,642,544	ඒඝිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		12,767,055	6,928,045	ඒඝිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**14,169,822**	**10,570,589**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		296,875,760	285,955,776	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(15,439,841)**	(16,737,406)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(15,439,841)	(16,737,406)	ඒඝිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒඝිඒ-3
300,000,000			(15,439,841)	(16,737,406)	

3.2 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධනය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කන්‍ය	
		2025	2024
		රු.	රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	168,569,279	165,969,107
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	21,547,081	16,738,789
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**190,116,360**	**182,707,896**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		19,921,956	16,382,869
දේපළ පිරියත හා උපකරණ සංචිතය		168,569,279	165,969,107
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,625,125	355,920
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**190,116,360**	**182,707,896**

පිටු අංක...7.....සිට ...27..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .....28.... සිට .....54.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
දිනය : 23 · 02 · 2026

.....
ගණන්දීමේ නිලධාරි
නම :
දිනය : 19.02.2026

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ අධ්‍යක්ෂ (මූල්‍ය)/ කළමනාකරු (මූල්‍ය)
නම :
දිනය : 19.02.2026

3.3 2025 දෙසැම්බර් 31 දිනෙන් වූ වසර සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	17,497,901	16,043,318
අග්‍රිම ලැබීම්	270,806,000	260,704,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,476,553	4,846,846
තැන්පතු ලැබීම්	2,671,972	3,551,653
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**296,452,426**	**285,145,817**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	182,291,325	168,698,589
සහනාධාර සහ මාරුකිරීම්	52,226,435	64,351,030
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	37,595,180	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	8,455,389	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	816	1,268,262
අත්තිකාරම් ගෙවීම්	11,880,342	5,814,949
තැන්පතු ගෙවීම්	1,402,767	3,642,544
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**293,852,254**	**243,775,374**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,600,172**	**41,370,443**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	2,600,172	41,370,443
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,600,172**	**41,370,443**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,600,172)**	**(41,370,443)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1. පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3 මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- ★ යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.
- ★ තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (රු)		එකතු කරන ලද ආදායම්	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.01	රජයේ ගොඩනැගිලි සහ නිවාස සඳහා කුලිය	6,000,000	6,000,000	8,309,540	138
2002.02.99	පොළිය හා වෙනත්	600,000	600,000	798,085	133
2003.99.00	වෙනත් ලැබීම්	1,500,000	1,500,000	1,451,454	97
2004.01.00	සමාජ ආරක්ෂණ සඳහා දායකත්වය (මධ්‍යම රාජ්‍ය)	-	-	6,938,821	-

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන(රු)		තක්ෂ වියදම් (රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූල්‍ය ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	253,000,000	253,000, 000	237,994,985	94
ප්‍රාග්ධන	47, 000,000	47, 000,000	44,710,953	95

3.7. මූ.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු)		තත්‍ය වියදම් (රු)	වැය කළ ප්‍රතිපාදන, අවසන් ප්‍රතිපාදනවල % ක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	දුම්රිය දෙපාර්තමේන්තුව	ප්‍රවේශ පත්‍ර	1,236,225	1,236,225	1,236,225	100
2	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය	ජාතික දීපාවලී උත්සවය 2025	1,350,000	1,350,000	1,041,000	77
3	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව	හින්දු සංස්කෘතික ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම	600,000	6,00,000	579,395	96
4	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්	ජ්‍යෙෂ්ඨ ලේඛකයින්ගේ ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම	1,200,000	1,200,000	1,200,000	100
5	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල	හින්දු වන්දනාකරුවන්ගේ විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම	4,000,000	4,000,000	3,936,205	98

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත (රු)	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	73,700,000	73,700,000		
9152	යන්ත්‍රෝපකරණ	48,869,279	48,869,279		
9153	ඉඩම්	46,000,000	46,000,000		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/සී/ඩීඑච්ආර්/2/2026/19 මෙයේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 ජූනි 23 දින

இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்
2 3 JUN 2026
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
Department of Hindu Religious and Cultural Affairs

අධ්‍යක්ෂ

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
  අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ වැය ලෙජරය අනුව වැය විෂයය අංක 204-2-1-5-2506 යටතේ දක්වා තිබූ ශේෂය රු.35,500,000ක් වීම හා භාණ්ඩාගාර පොත් අනුව එම වැය විෂයයෙහි ශේෂය රු.36,000,000ක් වීම හේතුවෙන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.500,000ක වෙනසක් පැවතුණි.

1.6.2 මූල්‍ය වන්කම්

(අ) දෙපාර්තමේන්තු ණයගැනි/ණයහිමි පාලන ගිණුම හා භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය තුළ මුදලින් බැර කිරීම් රු.5,476,553ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ 5) රු.510,863ක් වශයෙන් රු.4,965,690ක් අඩුවෙන් ද, වර්ෂය තුළ හරස් සටහන් මඟින් බැර කිරීම් රු.2,482,210ක් වුවද, ඒසීඒ 5හි රු.7,447,900ක් වශයෙන් රු.4,965,690ක් වැඩියෙන්ද සටහන් කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු ණයගැනි/ණයහිමි පාලන ගිණුම හා භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය තුළ මුදලින් හර කිරීම් රු.11,880,342ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ 5) රු.11,879,392ක් වශයෙන් රු.950ක් අඩුවෙන්ද, වර්ෂය තුළ හරස් සටහන් මඟින් හර කිරීම් රු.886,713ක් වුවද, ඒසීඒ 5 හි රු.887,663ක් වශයෙන් රු.950ක් වැඩියෙන්ද සටහන් කර තිබුණි.

1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

(අ) සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුම් අංක 6000-0-0-013-0-124-08 සඳහා තැන්පතු ලැබීම් රු.2,406,742ක් සහ දෙපාර්තමේන්තු පොත් අනුව ලැබීම් රු.2,384,482ක් වීම හේතුවෙන් තැන්පතු ලැබීම්වල රු.22,560ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුම් අංක 6000-0-0-013-0-124-08 සඳහා තැන්පතු ගෙවීම් රු.1,210,117ක් හා දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ගෙවීම් රු.1,187,557ක් වීම හේතුවෙන් තැන්පතු ගෙවීම්වල රු.22,560ක වෙනසක් පැවතුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්ථන වැය විෂයයන් 08ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.12,450,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.7,550,322ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 33 සිට සියයට 93ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ආ) එක් මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.1,300,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.677,051ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 52ක් විය.

(ඇ) එක් පුනරාවර්තන වැය විෂයයක් හා එක් මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.700,000ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 03ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදනය අතර සියයට 10 සිට සියයට 93ක පරාසයක් දක්වා වූ විචලතාවයක් පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(අ) ඡේදයේ සඳහන් පරිදි පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුළ ප්‍රථමයෙන් බැඳීම් හඳුනාගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 204-2-1-0-1101 වැය

විෂයය යටතේ රු.4,307කුත් 204-2-1-0-1409-104 වැය විෂයය යටතේ රු.461,518කුත් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි.

ආ) 2025 වර්ෂයට අදාළව දරන ලද එකතුව රු.527,888ක් වූ වියදම් 2026 වර්ෂයේ මුල් කාර්තුව තුළ ගෙවා තිබුණු බවට වවුචර් පරීක්ෂාවේදී නිරීක්ෂණය වුවද, අදාළ වියදම් 2025 වර්ෂයේ බැරකම් ලේඛනයට හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම III යටතේ වන බැරකම් වාර්තාව තුළට හෝ අන්තර්ගත කර නොතිබුණි.

1.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. (අදාල සහතිකවීම පිළිබඳ ප්‍රකාශනයක් 2025 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයනට පහළින් ඇතුලත් කර ඇත).

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාපනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.3 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 හා 5.2 ඡේදවල සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	134(3) රෙගුලාසිය	මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන විමසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ii)	1646 රෙගුලාසිය	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දින ගත වන්නට ප්‍රථමයෙන්, 268(අ) වැනි පොදු ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියන්ගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වාහන 03ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(iii)	1647(ඉ)	වාහන භාර නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව තමා බාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරයද, ලියාපදිංචි කිරීමේ අංකයද, තමන්ට භාරදුන් දිනයද, පැවරූ දිනය හා ඒ පිළබඳ වෙනත් නිසි තොරතුරු ද දැක්වෙන ලැයිස්තුවක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ)	**2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය**	දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් චක්‍ර ලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.
(ඇ)	**2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය**	මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කළ යුතු වුවද, එවැනි නිලධරයෙකු පත්කර නොතිබුණි.

3.5 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා ගන්නා ලද මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 09කදී ලබාදී තිබූ එකතුව රු.360,000ක් වූ අතුරු අග්‍රිම පියවීමේදී දින 28 සිට දින 60 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද, 2025 වර්ෂයේ මුල් මාස 04 සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම 2025 ජනවාරි 23 දින සිදු කර තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්

කළ යුතු වුවද, 2025 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම 2025 ජනවාරි 27 දින සිදු කර තිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම මඟින් වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන තිබූ හින්දූ අරිනරි පාසල්වල සහ ගුරු සේවාවේ විශිෂ්ඨත්වය ඇගයීම හා ප්‍රදානය කිරීම යන වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරන පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත්කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව දින 50ක ප්‍රමාදයකින් පසුව 2025 අගොස්තු 19 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2020 අගොස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයේ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් කාර්ය සාධන වාර්තාවේ,

(i) අනු අංක 1.7 යටතේ දැක්විය යුත්තේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු වුවද, කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 1.7 යටතට ශදුඅත විශ්ලේෂණයක් (SWOT Analysis) ඇතුළත් කර තිබුණි

(ii) 3 වන පරිච්ඡේදයේ 3.1, 3.2, 3.3 හා 3.4 යටතට ඇතුළත් කළ යුතු මූල්‍ය ප්‍රකාශ ඇතුළත් කර නොතිබීම සහ 3.7 සහ 3.8 යටතේ ඉදිරිපත් කළ යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 04 වන පර්ච්ඡේදය මඟින් ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ කාර්ය සාධන දර්ශක, මාර්ගෝපදේශයේ දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කරනු වෙනුවට වෙනත් ආකෘතියකට ඉදිරිපත් කර තිබුණි.

(ඇ) කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 07 වන පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර තිබූ අනුකූලතා වාර්තාව අනුව පහත සඳහන් අනුකූල නොවන අවශ්‍යතා සම්බන්ධයෙන් අනුකූල වන බව වාර්තා කර තිබුණි.

(i) විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.

(ii) අභ්‍යන්තර විගණන විමසුම්හි පිටපත් විගණකාධිපති වෙත එවීම.

(iii) වත්කම් මිලදී ගැනීම හ අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොමිප්ට්‍රෝලර් ජනරාල් වෙත යැවීම.

(iv) භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද ඌනතා සහ අතිරික්තතා සම්බන්ධයෙන් අදාල කාල සීමාව ඇතුළත සුදුසු පරිදි කටයුතු කිරීම.

(v) සංචිත වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සටහන් නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

(vi) වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(vii) 30/2016 චක්‍රලේඛය ප්‍රකාරව වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදු කිරීම.

(viii) වර්ෂය ඉක්මවා ඇති ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ එකතුව රු.2,600,171ක් වූ කාර්යාල උපකරණ මිලදී ගැනීම හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට යැවීමට කටයුතු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) අනුව පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම ඉදිරි මුදල් වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර සිදු කළ යුතු වුවත්, 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයෙන් හඳුනාගෙන තිබූ විකිණිය යුතු භාණ්ඩ 66ක්, අලුත්වැඩියා කළ යුතු භාණ්ඩ 08ක් හා විනාශ කළ යුතු භාණ්ඩ 106ක් සම්බන්ධයෙන් 2026 මැයි 20 දින වන විටත් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සිදු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම 2026 මාර්තු මාසය තුළ සිදු කර තිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී ඇතුලු නිලධාරීන්ගෙන් ඇප අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) වසර 20කට අධික කාලයක් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කර තිබුණු නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය සහ කුරුකුලම් ආනපන්දි උප කාර්යාලය පිහිටා ඇති ගොඩනැගිලි සහ ඊට අදාළ භූමිය යාපනය මහ නගර සභාවෙන් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණු අතර ඊට අදාළව යාපනය මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

(ආ) 2021 මාර්තු 01 දින සිට තනතුර අතහැර ගිය සංස්කෘතික සේවකයෙකුගෙන් අයවිය යුතු රු.212,800ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අය කරගෙන නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 134 (2) සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම විගණකාධිපති විමසා සිදු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.


5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2025 අප්‍රේල් 28 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ DMA/ADM/07/CIRCULAR දරන චක්‍රලේඛයේ 2.2 (i) ඡේදය අනුව සෑම කාර්තුවක් තුලම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් ප්‍රවර්තන වර්ෂයට අදාලව පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයට අදාල දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 184ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 163ක් වීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 10ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 08ක්ද වශයෙන් තනතුරු 21ක් පුරප්පාඩුව පැවතුණි.



කේ.එච්.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1 හින්දු අරනෙරි දහම් පාසල් ප්‍රවර්ධනය / සංවර්ධනය

අංකය	ක්‍රියාකාරකම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100 – 90 %	75- 89 %	50 - 74 %
1	හින්දු අරනෙරි පාසල් (දහම් පාසල්) සිසුන් සඳහා පවත්වන ලද පන්නිසායි, යෝග සහ නායකත්ව පුහුණු වැඩසටහන් ගණන	√		
2	දක්ෂතා සහ නිර්මාණශීලිත්වය වෙනුවෙන් හඳුනාගෙන සම්මාන ලැබූ සිසුන් සංඛ්‍යාව	√		
3	හින්දු අරනෙරි පාසල් සිසුන්ට මිලදී ගෙන බෙදා හරින ලද පොත් සහ සංගීත භාණ්ඩ ගණන	√		
4	හින්දු අරනේරි පාසල් සිසුන් සඳහා නව විෂය මාලාවක් ක්‍රියාත්මක කිරීම සඳහා මුද්‍රණය කර බෙදා හරින ලද පෙළ පොත් ගණන	√		
5	හින්දු අරනේරි අධ්‍යාපනය දිරිමත් කිරීම සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන	√		
6	පුස්තකාල සහ නිල ඇඳුම් දීමනා සහ පුහුණු වැඩසටහන් ලබා දීමෙන් දිරිමත් කරන ලද හින්දු අරනෙරි පාසල් ගුරුවරුන් සංඛ්‍යාව		√	

4.1.2 හින්දු කෝවිල් හා ආයතනය සංවර්ධන කිරීම

අංකය	ක්‍රියාකාරකම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100 – 90 %	75- 89 %	50 - 74 %
1	ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මූල්‍යධාර ලැබුණු හින්දු කෝවිල් සහ ආයතන සංඛ්‍යාව	√		
2	දරුවන්ගේ අධ්‍යාපනය සඳහා මූල්‍යධාර සපයන අනාථ නිවාස සංඛ්‍යාව	√		
3	පුනරාවර්තන වියදම් සඳහා මූල්‍යධාර ලැබුණු හින්දු කෝවිල් සහ ආයතන ගණන	√		
4	මුද්‍රණය කර නිකුත් කරන ලද නන්දි කොඩි ගණන	√		
5	"නල්ලෙයි තිරුඥානසම්බන්දන් ආතීනම් " හි පවත්වන ලද සංස්කෘතික වැඩසටහන් සංඛ්‍යාව	√		
6	ප්‍රදේශීය මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම	√		
7	හින්දු සංස්කෘතික අරමුදල් ක්‍රියාකාරකම් සඳහා දායක වූ මුදල	√		

4.1.2 හින්දු ආගමික හා සංස්කෘතික ප්‍රවර්ධනය

අංකය	ක්‍රියාකාරකම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100 – 90 %	75- 89 %	50 - 74 %
1	පවත්වන ලද හින්දු ආගමික උත්සව සහ ගුරු පූජා ගණන	√		
2	ආගමික හා අධ්‍යාත්මික දැනුවත්භාවය ඇති කිරීම සඳහා පවත්වන ලද ගුවන් විදුලි වැඩසටහන් ("අරනේරි ෂරම්") ගණන	√		
3	හින්දු ආගමික, අධ්‍යාත්මික සහ සංස්කෘතික විෂයයන් (අන්මේහ පිරසරකර් සහ පන්නිසායි පන්ති) යටතේ පවත්වනු ලබන මූලික සහ උසස් පාඨමාලා හැදෑරීමෙන් ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව	√		
4	පවත්වන ලද දිව්‍ය ගම්මාන වැඩසටහන් සහ ආගමික සහජීවන වැඩසටහන් ගණන	√		

4.1.4 හින්දු ආගමික පර්යේෂණ පැවැත්වීම

අංකය	ක්‍රියාකාරකම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100 – 90 %	75- 89 %	50 - 74 %
1	විකිණීම සඳහා මුද්‍රණය කරන ලද හින්දු ආගමික පොත්වල සංඛ්‍යාව	√		
2	හින්දු ආගම පිළිබඳ පවත්වන ලද පර්යේෂණ සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන ගණන	√		

4.1.5 හින්දු දමිළ කලා සංස්කෘතික ප්‍රවර්ධනය

අංකය	ක්‍රියාකාරකම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100 – 90 %	75- 89 %	50 - 74 %
1	තම කුසලතා වැඩි දියුණු කර ගැනීමට දිරිමත් කරන ලද කලාකරු-වන් සංඛ්‍යාව	√		
2	හින්දු ආගමික දෙමළ කලාව සහ සාහිත්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් හින්දු දෙමළ පොත් මිලදී ගත් ශ්‍රී ලාංකික ලේඛකයින් සංඛ්‍යාව.	√		

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අඳාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
ඉලක්කය 16 තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියල්ලන්ගෙන් සමන්විත ප්‍රජාවන් ප්‍රවර්ධනය කිරීම හා සැමට යුක්තිය ඉටු කිරීම සහ සියලු මට්ටම්වල කාර්යක්ෂම හා වගකිවයුතු ක්‍රියාකාරී ආයතන පිහිටුවීම.	ඉලක්කය 16.6 සියලු මට්ටම්වල කාර්යක්ෂමතා, ගිණුම්කරණ වගකිවයුතු සහ විනිවිද පෙනෙන සමාගම් ඇති කිරීම.	දර්ශකය 16.6.1 අංශය විසින් අනුමත කරන ලද අයවැයෙන් (හෝ අයවැය දර්ශක (වියදම් ශීර්ෂයන්) හෝ ඊට සමාන) ප්‍රාථමික රජයේ වියදම්			√

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ඉහත දර්ශකය රජයේ අයවැය සැලසුම්වල විශ්වසනීයත්වය පවත්වා ගැනීමට උත්සාහ කරයි. රජයන් තමන් අපේක්ෂා කරන දේ සඳහා වියදම් කරන්නේද සහ ඔවුන් රැස් කිරීමට අදහස් කරන අරමුදල් රැස් කරන්නේද යන්න. සෑම මට්ටමකින්ම කාර්යක්ෂම, වගවීම සහ විනිවිද පෙනෙන සමාගම් බිහිකිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විශිෂ්ටත්වය ලබාගෙන ඇත. වාර්ෂික අයවැය හරහා අංක 204 දරණ ප්‍රධාන වියදම් ශීර්ෂය හරහා 2025 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට ලබා දී ඇති රුපියල් මිලියන 300.00 න් රුපියල් 282.74 ක් ඵලදායී ලෙස වියදම් කර ඇත. එම මුදල් අනුමත අයවැයෙන් සියයට 94 % කි.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක සංඛ්‍යාව	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යා	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	06	03	03
තෘතීයික	01	01	-
ද්විකියික	155	145	10
ප්‍රාථමික	22	14	08
එකතුව	**184**	**163**	**21**

6.2 මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි ඇති කරන බලපෑම.

ආයතනයක කාර්යසාධනය මනිනු ලබන්නේ එම ආයතනයේ ඵලදායිතාව හෝ ප්‍රතිඵල අනුව එහි අපේක්ෂිත ප්‍රකාශන හෝ අරමුණු හා ප්‍රතික්‍රියා මගිනි. දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වන අතර සංවිධානයේ වැඩ ප්‍රමාණය අඩු කරන අතර එමඟින් ආයතනයේ වර්ධනය ප්‍රවර්ධනය වන අතර ආයතනයේ සේවකයින්ට ප්‍රතිලාභ ලැබේ.

2025 වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 184 ක් විය. දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ (හින්දු කෝවිල හා හින්දු කටයුතු) සහ පරිපාලන නිලධාරී යන තනතුරු මුළු වර්ෂය තුළ පුරප්පාඩු විය.

2025 වසර අවසානයේ මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සංඛ්‍යාව 21ක් වූ අතර, 2024 දී මෙම සංඛ්‍යාව 23ක් විය.

6.3 මානව සම්පත් සංවර්ධන

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහන්-න් කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
				දේශීය	විදේශීය		
01	සමීක්ෂණ මණ්ඩලය සහ අත්තිකාරම් B' ගිණුම	22	දින 01	8,700.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි
02	සමීක්ෂණ සහ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි	38	දින 02	44,410.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි
03	"පිරිසිදු ශ්‍රී ලංකාව" පුහුණුව	76	දින 01	85,000.00	-	දේශීය	වැඩිදියුණු කළ අපද්‍රව්‍ය කළමනාකරණය සහ වඩාත් ආරක්ෂිත, පිරිසිදු කාර්යාල පරිසරයක්
04	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	02	දින 03	36,000.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි
05	අභිප්‍රේරණය, ප්‍රසම්පාදනය සහ MS Excel	38	දින 05	183,150.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි
06	මූල්‍ය නියාමනය, සාමාන්‍ය කාර්යාල පරිපාලනය සහ පරිගණක යෙදුම	43	දින 04	160,800.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි
07	මූල්‍ය නියාමනය, සාමාන්‍ය කාර්යාල පරිපාලනය සහ යෝග	38	දින 03	183,950.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි
08	නැගෙනහිර පළාත් කාර්ය මණ්ඩලය සඳහා මූල්‍ය නියාමනය සහ සාමාන්‍ය කාර්යාල පරිපාලනය	50	දින 03	250,000.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාල ක්‍රියා පටිපාටි

ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය

ආයතනයේ ප්‍රගතිය සඳහා වඩාත් කාර්යක්ෂම හා බුද්ධිමත් මෙහෙයුම් කාර්ය මණ්ඩලය අත්‍යවශ්‍ය වේ. පුහුණුව ලබා දීම සේවක ඵලදායිතාව ඉහළ නංවන අතර සේවකයාගේ සේවය වැඩි දියුණු කරයි. ආයතන තුළ ධනාත්මක වෙනසක් ඇති කරයි. පුහුණුව අපැහැදිලි තොරව තිබෙන විෂයන්වල බලපෑම ඇති කර ස්ථිරභාවය ලබා දෙයි.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව වසර පුරා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීය. දෙපාර්තමේන්තුවට අනුබද්ධ නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා ඔවුන් විවිධ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන අතර අඛණ්ඩ අධීක්ෂණය කර ඇත.

අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර මහජනයාට සේවා සැපයීම වැඩිදියුණු කිරීමේ හැකියාව වැඩි කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ සමස්ත පද්ධතියම ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව සංවර්ධනය කිරීමේ ප්‍රවේශයක් කරා යොමු කිරීම සහ සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින සියලුම නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා පරිපාලන ශාඛාව කටයුතු කරයි.

වෙනත් ක්‍රියාකාරකම් පුහුණු ප්‍රවේශයන් හඳුනා ගැනීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම සහ බාහිර ආයතන හරහා කාර්ය මණ්ඩල පුහුණු අවස්ථා ලැබීමට අදාළ ක්‍රියාකාරකම්, එම ප්‍රවේශයට සරිලන පරිදි මානව සම්පත් වැඩසටහන් වලට අදාළ පුහුණු කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන තුළින් හඳුනාගත් නිපුණතා අනුව ගැලපීම මගින් තෝරාගෙන පුහුණු කිරීම් කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව මුහුණ දෙන පුහුණුව හා සංවර්ධනයේ ඇති ප්‍රධාන අභියෝගයක් වන්නේ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරාලීම සඳහා වෙනත් පුහුණු සපයන්නන් සේවාව මත අවශ්‍ය වේ. පුහුණු සපයන්නන් සමඟ සමීප හා නිරන්තර සම්බන්ධතා පවත්වා ගැනීම උපකාරී වේ.

අනුකූලතා වාර්තාව

අංකය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ශික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්-වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්-වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යා-වත්කාලීන කර පවත්-වාගෙන යාම	අනුකූලවේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළිගැයලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විග ණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(භෘඊ) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්- වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ134(2) DM/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විග ණන සැලැස්ම සකස් කිරීම.	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමන- ාකරණ විගණන දෙප- ාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විග ණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩල හිඟය සහ වැඩ බර හේතුවෙන් රැස්වීම් 03 ක් පවත්වන ලදී.	ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම පිළබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණ සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛණයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූලවේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූලවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104.109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරනරාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූලවේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූලවේ		
12	**රජයේ නිලධාරන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	සේවය අත්හැර යාම තබලපෑමට ලක් වූ නිලධාරියා ණය ආපසු නොගෙවූ නිසා ණය මුදල හිඟ වී ඇත.	රජයේ ක්‍රියා පටිපාටි රීතිවලට අනුව ඉතිරි මුදල එකතු කිරීමට පියවර ගනු ලැබේ
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මොහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අදාළ නොවේ		
15.2	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ.176 අනුව හිග ආදායම් වාර්තා විග ණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්-ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		

17.3	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම	අනුකූලවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6,5ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූලවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූලවේ		

ජාතික තෙපොංගල් උත්සවය යාපනයේ දී සමරනු ලැබිය









පාර්ලිමේන්තුවේ පැවති තෙපොංගල් උත්සවය








77වන ජාතික නිදහස් දින සැමරුම
කොළඹ මයුදපති ශ්‍රී පතිරකාලි අම්මාන් විහාරස්ථානය





නල්ලූර් උත්සවය අතරතුර පවත්වන ලද
"දෙයිවීකත් තිරුක් කූට්ටම්" වැඩසටහන්





නල්ලූර් උත්සවය අතරතුර පවත්වන ලද
"දෙයිවීකත් තිරුක් කූට්ටම්" වැඩසටහන්







මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික නිර්මාණශීලීත්ව සම්මාන සඳහා තෝරා ගැනීමේ වැඩසටහන





මඩකලපුවේදී පැවති දිව්‍ය ගම්මාන උත්සවය





අරනේරි පාසල් සිසුන් විසින් ජාත්‍යන්තර යෝග දිනය සමරනු ලැබීය





හින්දු සාන්තුවරයන් සඳහා ගුරු පූජා සැමරීම





ස්වාමි විපුලන්තර්ගේ 133 වන උපන්දිනය සහ පැවිදි වීමේ ශත සංවත්සරය රටේ බොහෝ ප්‍රදේශවල සමරනු ලැබීය.





පාර්ලිමේන්තුවේ නවරාත්‍රී පූජාව සමරනු ලැබීය





ජාතික දීපාවලි උත්සවය හැටන් සමරනු ලැබිය








අධ්‍යාත්මික හා මානසික සංවර්ධන පුහුණුව





හින්දු ආගමික සහතික පත්‍ර අවසාන විභාග සම්මන්ත්‍රණය



